# පුංචි දියකිඳුරි



ඉසලි නිසලක්‍ෂා නෙත්වින්දි

# පිදුම

**මාගේ ආදරණීය අම්මා,**

**අප්පච්චි**

**සහ අක්කාට........**

# පුංචි දියකිඳුරි


## ඉසලි නිසලයා නෙත්වින්දි


## 2 වසර A


## 978-624-208-458-9

## 2025.02.02

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එදා ලස්සන දවසක්. ලස්සනට ඉර
පායලා තිබුණා. පුංචි දියකිඳුරි එයාගේ
යාළුවෝ එක්ක සෙල්ලම් කරමින් හිටියා.
එයාලා එහාට පීනුවා.
මෙහාට පීනුවා. රවුම්
කැරකී කැරකී පිනුම් ගැහුවා. දිය
කිඳුරියට හොඳටම මහන්සියි. එයා
ගලක් උඩට වෙලා මහන්සි ඇරියා.



පුංචි ළමයි ටිකක් මුහුදු වෙරළේ සෙල්ලම් කරනවා එයා දැක්කා. එයාලා ලස්සන මාල, වළලු දාගන ඉන්නවා පුංචි දියකිඳුරි දැක්කා.



මටත් ලස්සන මාල කරාබු තිබුණා නම් පුංචි
දියකිඳුරියට හිතුණා.
එයා පැත්තකට වෙලා දුකින් කල්පනා
කරකර ඉන්නවා. එයාගේ අම්මා
දැක්කා.ඇයි මගේ සුදු දුව මොනවද
කල්පනා කරන්නේ අම්මා ආදරෙන් ඇහුවා.
මුහුදු වෙරලේ සෙල්ලම් කරන ළමයින්ට
ලස්සන මාල, වළලු තියෙනවා මටත් ආසයි
ලස්සන මාල, වළලු දාන්න.

ඒත් මට ඒවා නෑනේ. දියකිඳුරිය දුකෙන් කිව්වා. අම්මට පුංචි දිය කිඳුරිය ගැන හොඳටම දුකයි.
ඒත් මුහුදේ ඉන්න අපට කොහෙන්ද ලස්සන මාල, වළලු අම්මා හිතුවා.





පුංචි දිය කිඳුරි කන්නෙත් නෑ, බොන්නෙත් නෑ, කල්පනාවමයි. අම්මා දියකිඳුරියව සනසවන්න උත්සහ කළා.

රස කෑම හදලා දුන්නා. කතන්දර කියලා දුන්නා. කිසිම දේකට දිය කිඳුරියව සනසන්න පුළුවන් වුණේ නෑ.

අම්මා ටිකක් කල්පනා කළා.
අම්මට හොඳ උපායක් මතක් වුණා.
අම්මා මුහුදේ තැන තැන වැටිලා තිබුණ මුතු ඇට අහුලා ගත්තා. මුහුදේ වැවිලා තිබුණ වැල් ටිකක් කඩා ගත්තා.
ඒවා එකට අමුණලා ලස්සන මාලයක් හැදුවා.





ඒක දිය කිඳුරිගේ බෙල්ලේ ගැට ගැහුවා.

දියකිඳුරියට හරිම සතුටුයි.

මගේ අම්මා මට කොච්චර ආදරේද දියකිඳුරි හිතුවා.



එයා අම්මා බදාගෙන හාදුවක් දුන්නා.
අම්මලා ලඟ කොහොමහරි ප්‍රශ්න වලට
උත්තරයක් තියෙනවා අම්මා මගේ වීරයා.
පුංචි දියකිඳුරිය හිතුවා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණාකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්